# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2178/27 - 2020 ජුනි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2020.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට මීගමුව අපජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය යටතේ ඔවිටියාවත්ත අපජල නල එලීම සඳහා මීටර් 3ක් පළල මාර්ගයක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය,
5/3/GQ/01.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 77, උතුරු පල්ලන්සේන ග්‍රාම නිලධාරි වසමේ ඔවිටියාවත්ත ගමේ පිහිටි මේ සමග එවන දල සැලැස්මේ පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් පර්චස් 20.75ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස,

උතුරට : මීගමුව නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය බැහැර කරන භූමිය.
නැගෙනහිරට : යෝජිත අපජල පිරිපහදු මධ්‍යස්ථානය (කේ. එල්. සී. ඒ. පෙරේරා මහතාගේ ඉඩම).
දකුණට : පුද්ගලික ඉඩම.
බටහිරට : රණවිරු ලක්ෂ්මන් ජයසිංහ මාවත.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : නොදනී.

06 - 146


1A - G 032298 — 28 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*